12 ශ්‍රේණිය ගිණුම්කරණය - 3 වන සතිය - මැයි 18 සිට 22 දක්වා

## නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශය

### නිපුණතා මට්ටම 7.2 - නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන ඇසුරෙන් තීරණ ගැනීම

භාණ්ඩ නිෂ්පාදනය සිදු කරන ව්‍යාපාරයක එහි පිරිවැය නිවැරදිව ගණනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මේ සඳහා ව්‍යාපාරය විශේෂිත ප්‍රකාශයක් පිළියෙල කරයි.එය නිෂ්පාදන පිරිවැය ලේඛනය නම් වේ.නිෂ්පාදන පිරිවැය ලේඛනයේ ආකෘතිය පහත දැක්වේ.

………………..ව්‍යාපාරය

…………………..දිනෙන් අවසන් වර්ෂය සඳහා

නිෂ්පාදන පිරිවැය ලේඛනය

(රු.000)

| | | |
|---|---|---|
| ආරම්භක අමුද්‍රව්‍ය තොගය | | XXX |
| අමුද්‍රව්‍ය ගැනුම් | XX | |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | XX | |
| අමුද්‍රව්‍ය පැටවීමේ ගාස්තු | XX | |
| | XX | |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | (X) | XX |
| | | XX |
| අමුද්‍රව්‍ය තොග හානි /විනාශ වීම් | | (X) |
| පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය | | XX |
| **සෘජු ශ්‍රමය** | | |
| සෘජු වැටුප් | | XX |
| **සෘජු වෙනත් වියදම්** | | |
| පුරස්කාරය | X | |
| වෙළෙඳ ලකුණු | X | |
| අනෙකුත් සෘජු පිරිවැය | X | XX |
| ප්‍රාථමික පිරිවැය | | XX |
| **කම්හල් පොදු කාර්ය පිරිවැය** | | |
| ඉන්ධන | X | |
| යන්ත්‍ර ක්ෂය | X | |
| යන්ත්‍ර නඩත්තු වියදම් | X | |
| අනෙකුත් නිෂ්පාදන පොදු කාර්ය වියදම් | X | XX |
| | | XX |
| **නොනිමි තොගය** | | |
| + ආරම්භක තොගය | | X |
| | | XX |
| - අවසන් තොගය | | (X) |
| නිෂ්පාදන පිරිවැය | | XX |

පහත දැක්වෙන තොරතුරු ඇසුරින් හයිඩ්‍රාමණී ඇඟලුම් ආයතනයේ 2020/03/31න් අවසන් වර්ෂයේ නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කරන්න.

අමුද්‍රව්‍ය ගැනුම් 200,000

පුරස්කාරය 70,000

සෘජු වැටුප් 280,000

2019/04/01 අමුද්‍රව්‍ය 30,000

බලය 25,000

ඉන්ධන 20,000

අමුද්‍රව්‍ය ආපසු යැවුම් 16,000

ගෙන ඒමේ කුලී -අමුද්‍රව්‍ය 14,000

නොනිමි-ආරම්භක 18,000

අවසාන 16,000

අමුද්‍රව්‍ය අවසන් තොගය 28,000

යන්ත්‍ර ක්ෂය 35,000

කර්මාන්ත ශාලා කුලී 40,000